මගේ අංකය: JSC/SEC/CIR- L/2022

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 14/2022**

සියලුම විනිශ්චයකාරවරුන් සහ සියලුම අධිකරණ නිලධාරීන් වෙත,

**<u>අධිකරණ මඟින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමේ දී ඇතිවන ගැටලු සම්බන්ධවයි.</u>**

ශීර්ෂගත කරුණට අදාළව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හරහා අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල් එච්.එම්.ටී.එන්.උපුල්දෙනිය මහතාගේ අංක: **කේ08/වාර්තා/විවිධ/2022** හා 2022.11.24 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව සමස්ථයක් වශයෙන් එම ලිපියත්, විශේෂයෙන් එම ලිපියේ අවසාන ඡේදයේ සඳහන් කාරණා ත්‍රිත්වයත් ඔබගේ අවධානයට ලක් කරන ලෙස මට නියම කර ඇත.

02. ඒ අනුව අවශ්‍ය කටයුතු සඳහා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් එච්.එම්.ටී.එන්.උපුල්දෙනිය මහතාගේ 2022.11.24 දිනැති ලිපිය හා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2022.11.30 දිනැති ලිපියේ පිටපත් මීට අමුණා අධිකරණ සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පලකොට ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 දෙසැම්බර් මස 23 වන දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය

දුරකථනය / தொலைபேசி / Telephone 2449959
ලේකම් / செயலாளர் / Secretary
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk
ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785
Web Site: www.moj.gov.lk

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும்அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு

Ministry of Justice, Prison Affairs and Constitutional Reforms

තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. 555
විද්‍යුත් තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov.lk
නො 19, ශ්‍රී සංඝරාජ මාවත කොළඹ 10
இல19, ஸ்ரீசங்கராஜ மாவத்த கொழும்பு 10
No 19, Sri Sangaraja Mw Colombo 10

05 DEC 2022

මගේ අංකය / எனதுஇல / My No. MOJ/L13/JSC/2020

ඔබේ අංකය / உமது. இல. / Your No.

දිනය / திகதி / Date 2022.11.30

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

<u>ගරු අධිකරණ මගින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමේ දී ඇති වන ගැටලු සම්බන්ධවයි</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අප වෙත යොමු කරන ලද SMPRPR/PRI/05/මත් නිවාරණ හා 2022.11.28 දිනැති ලිපිය හා බැඳේ. (එකී ලිපියෙහි පිටපතක් මේ සමග අමුණා ඇත.)

එම ඉල්ලීම් ලිපියෙහි දක්වා ඇති කරුණු අනුව, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමේ දී ඇති වන ගැටලුකාරී තත්වය මගහැරීම කෙරෙහි ප්‍රධාන කරුණු 03ක් සම්බන්ධව සලකා බැලීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව සියලු ම මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන්නේ නම් මැනවි.

පියුමිනි පීරිස්
අතිරේක ලේකම් (නීති)
ලේකම් වෙනුවට
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත: අතිරේක ලේකම්(විශේෂ ව්‍යාපෘති), බන්ධනාගාර කටයුතු අංශය, රාජගිරිය

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09

බන්ධනාගාර මූලස්ථානය
சிறைச்சாலைத் தலைமையகம்
PRISON HEADQUARTERS

150, බේස්ලයින් පාර, කොළඹ 09. 150, பேஸ்லைன் வீதி,கொழும்பு 09. 150, Baseline Road, Colombo-09.

| | | | |
|---|---|---|---|
| දුරකථන தொலைபேசி Telephones | කාර්යාලය அலுவலகம் Office 2695204 4677177 | කොමසාරිස් ජනරාල් ஆணையாளர் நாயகம் Commissioner - General 2691976 | කොමසාරිස් ஆணையாளர் Commissioner 2695221 2692818 | ෆැක්ස් பெக்ஸ் Fax 2695206 4677180 |


මගේ අංකය எனது இல. My No. කේ08/වාර්තා/විවිධ/2022 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022.11.24

ලේකම්
අධිකරණ , බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
ශ්‍රී සංඝරාජ මාවත
කොළඹ 10.

<u>ගරු අධිකරණ මගින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමේදී ඇතිවන ගැටළු සම්බන්ධවයි</u>

උක්ත කාරණයට අදාලව අධිකරණ මගින් බන්ධනාගාර අමදිවි රිද්ම පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහා රැඳවියන් යොමු කිරීමේදි අධික රැඳවියන් ප්‍රමාණයක් බන්ධනාගාර ආයතන වෙත යොමුකිරීම හේතුවෙන් මේ වන විට එම ආයතන වල පුනරුත්ථාපන කටයුතු හා පරිපාලන කටයුතු වලට අහිතකර ලෙස බලපා ඇති බව ආයතන වල අධිකාරීවරුන් විසින් මාවෙත වාර්තා කර ඇත.

කන්දකාඩු පුනරුත්ථාපන කඳවුර තුළ පුනරුත්ථාපනලාභීන් ඇතුළත් කිරීම සීමාකර ඇති අතර, පසුගිය 2022.11.06 වන දින එම කඳවුරේ ඇතිවූ කලහකාරී තත්වය හේතුවෙන් එහි සිටි රැඳවියන් 213 දෙනකු ද බන්ධනාගාර ආයතන වෙත මාරු කිරීම හේතුවෙන් බන්ධනාගාර මත්ද්‍රව්‍ය පුනරුත්ථාන මධ්‍යස්ථාන වල මේ වන විට දැඩි තදබදයක් ඇති වී ඇත.

බන්ධනාගාර පුනරුත්ථාපන කඳවුරු තුළ රැඳවිය හැකි ප්‍රමාණයන්ද, සීමාව ඉක්මවා ඇති අතර, විශේෂයෙන් වෙනත් නඩු සහිතව මත්ද්‍රව්‍ය පුනරුත්ථාපනයට යොමු කරන රැඳවියන් එළිමහන් සිරකඳවුරුවලට යොමුකල නොහැකි බැවින් ඒ පිළිබඳව සලකා මහර හා අගුණකොළපැලැස්ස බන්ධනාගාරවල ද පුනරුත්ථාපන වැඩසටහන් සඳහා වෙනනම අංශයක් ආරම්භ කරන ලදි. එසේ වුවත් එම ආයතන දෙකේ ඇත්තේ ඉතා සීමිත ඉඩකඩ ප්‍රමාණයකි. ඒ අනුව මෙම ආයතන දෙකේ රැඳවිය හැකි ප්‍රමාණය පහත දක්වා ඇත.

| අනු අංකය | පුනරුත්ථාපන මධ්‍යස්ථානය | රැඳවිය හැකි සංඛ්‍යාව | දැනට රඳවා ඇති සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | අගුණකොළපැලැස්ස | 75 | 140 |
| 02 | මහර බන්ධනාගාරය | 80 | 204 |

පවතින ඉඩකඩ පහසුකම් පිළිබඳව ගරු අධිකරණ දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබුවත් දිගින් දිගටම රැඳවියන් යොමුකිරීම නිසා ගැටළු සහගත තත්වයක් ඇති වී ඇත. මෙම මධ්‍යස්ථාන වල ඉඩකඩ ලැබෙන තෙක් ඇතැම් අවස්ථාවල සති කිහිපයක් ඇතුලත් කරන ලද ආයතනවලම රැඳවියන් රැඳවීමට සිදුව තිබීම ගරු අධිකරණවල මගින් දෝෂ දර්ශනයට ලක්කළ අවස්තාද ඇත. එසේම ගරු අධිකරණ මගින් ඇතැම් අවස්ථාවල පුනරුත්ථාපන මධ්‍යස්ථානය නම් කර නියෝග ලබා දීම නිසා ඉඩකඩ ඇති ආයතන වෙත නේවාසිකයන් යොමු කිරීමද ගැටළු සහගත වී ඇත. මේනිසා බන්ධනාගාර නිලධාරීන් හට මෙම තත්ත්වය කළමනාකරණය කර ගැනීමට දැඩිසේ අපහසුවී ඇත.

මත්ද්‍රව්‍ය පුනරුත්ථාපය විධිමත්ව පවත්වාගෙන යාම සිදුකරනු ලබන්නේ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය යටතේ ඇති කණ්දකාඩු හා සේනපුර පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා අන්තරාකාර ඖෂධ පාලක මණ්ඩලයයේ ආයතන මගින් වන අතර බන්ධනාගාර මධ්‍යස්ථාන ආරම්භ කරනු ලැබුවේ එම කඳවුරුවලට යොමුකිරීමට හැකියාවක් නොමැති බන්ධනාගාර ගතවන රැදවියන් පුනරුත්ථානය සඳහාවේ.

මේ ආකාරයෙන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැවුවන් අධික ලෙස බන්ධනාගාර වෙත යොමු කිරීම බන්ධනාගාර අභ්‍යන්තර පාලනයට අහිතකර ලෙස බලපාන අතර බන්ධනාගාර වල විනය පවත්වාගෙන යාමද ගැටළුවක් වී ඇත. එසේම බන්ධනාගාර ඇතුලතද ගැටුම් ඇති වී කලහකාරි තත්ත්වයන් ඇති වීමට ද හේතුවක් විය හැකිය.

එබැවින් පහත සඳහන් කරුණු කෙරේ ගරු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානය යොමුකර ගරු මහේස්ත්‍රාත්තුමන්ලා දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙනමෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

01. විසඳීමට වෙනත් නඩු සහිත මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවුන් පුනරුත්ථාපනයට යොමුකිරීමේදි පවතින ඉඩ පිළිබඳව අධිකාරිගෙන් වාර්තාවක් ලබාගෙන රැදවියන් යොමුකිරීම හෝ සියළු නඩු අවසානයේ පුනරුත්ථාපනයට යොමුකිරීම.

02. බන්ධනාගාර පුනරුත්ථාපන මධ්‍යස්ථානය නම් නොකර මත්ද්‍රව්‍ය පුනරුත්ථාපනයට යොමුකිරීම.

03. හැකි සෑම අවස්ථාවකම මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවුන් බන්ධනාගාර පුනරුත්ථාපනයට යොමු නොකර පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාශයේ මධ්‍යස්ථාන, අන්තරාකාර ඖෂධ පාලක මණ්ඩලයේ මධ්‍යස්ථාන හෝ ප්‍රජාවිශෝධනය සඳහා යොමුකිරීමට කටයුතු කිරීම.

එච්.එම්.ටී.එන් උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්